## තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

මෙම ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. ශිල්ප ප්‍රදර්ශක II ශ්‍රේණිය - Craft Demonstrator Grade II (Foundry Work and Sheet Metal Work)

**අවශ්‍ය සුදුසුකම්:**

1. පහත සඳහන් ක්ෂේත්‍ර එකක් හෝ කිහිපයක පළපුරුද්ද සමග අදාළ ක්ෂේත්‍රයේ **(Foundry Work and Sheet Metal Work)** පළපුරුද්ද ලබා තිබිම,
**(Foundry Practice, Welding & Smithy, Machine Tools, Pattern Making, Sheet Metal Work, Carpentry and Metal Work)**

සහ

2. විශ්වවිද්‍යාල/රජයේ සේවයේ හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පුහුණු ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසර (15) පළපුරුද්දක් ලබා තිබීම හෝ,

3. විශ්වවිද්‍යාල/රජයේ සේවයේ හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පුහුණු විශේෂ ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර (03) පළපුරුද්දක් ලබා තිබීම.

බඳවා ගනු ලබන ආකාරය : ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 49,475 – 17x540– 58,655 (U- MN 1(III)]මාසික

### 02. තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය "ආ" ඛණ්ඩය - Technical Officer Grade II Segment "B"

**අවශ්‍ය සුදුසුකම්:**

(1) (අ) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යා විෂය ධාරාව හෝ භෞතික විද්‍යා විෂය ධාරාව හෝ තාක්ෂණික විෂය ධාරාවෙන් එක් වරකදී විෂයයන් 03 කින් සමත්ව තිබීම.

සහ

(ආ) තනතුරට අදාළව අවම වශයෙන් වසරක (පූර්ණ කාලීන) කුසලතා-මූලික විධිමත් පුහුණු වැඩසටහනක් හෝ ඊට සමාන සුදුසුකමක් සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතුය. එම පුහුණු වැඩසටහනේ සුදුසුකම හා පිළිගැනීම අදාළ පීඨය/අංශය විසින් තීරණය කරනු ඇත.

සටහන:- බඳවාගනු ලබන්නන් අවුරුදු (03) ක පුහුණුවීමේ කාලසීමාවකට යටත්ව "පුහුණුවන තාක්ෂණික නිලධාරී" වශයෙන් පත් කරනු ලැබේ. සාර්ථක පුහුණු කාලසීමාව අවසානයේ තනතුරෙහි තහවුරු කර තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය "ආ" ඛණ්ඩය තනතුරට පත් කරනු ඇත.

බඳවා ගනු ලබන ආකාරය : ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 51,095 – 7x540; 10 x640– 60,575 (U- MT 1(III)]මාසික

### 03. ක්‍රීඩාගාර සහායක III ශ්‍රේණිය - Gymnasium Attendant Grade III

**අවශ්‍ය සුදුසුකම්:**

i. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය සම්මාන සාමාර්ථයන් දෙකක් ද (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරනු ලබන ක්‍රීඩාගාර සහායක තනතුරට අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටමේ 2 හෝ 3 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

ii. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය සම්මාන සාමාර්ථයන් දෙකක් ද (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සහිත වසරක (01) සේවා පළපුරුද්දක් තිබීම.

බඳවා ගනු ලබන ආකාරය : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 44,575 – 16x490– 52,415 (U- PL 2(III)]මාසික

### 04. රියදුරු III ශ්‍රේණිය - Driver Grade III

**අවශ්‍ය සුදුසුකම්:**

i. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ 02 ක් සහිතව විෂයන් 06 කින් සමත්ව තිබීම.

සහ

ii. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කර ඇති, බර වාහන පැදවීම සඳහා වූ රියදුරු බලපත්‍රයක් තිබීම හා බර වාහන රියදුරු බල පත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර 03ක් රියදුරු තනතුරෙහි පළපුරුද්දක් ලබා තිබීම.

බඳවා ගනු ලබන ආකාරය : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 48,005 – 16x490– 55,845 (U- PL 3(III)]මාසික

## 05. කම්මල්කරු III ශ්‍රේණිය - Blacksmith Grade III

**අවශ්‍ය සුදුසුකම්:**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන කම්මල්කරු තනතුරට අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

බඳවා ගනු ලබන ආකාරය : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 48,005 – 16x490 – 55,845 (U- PL 3(III)]මාසික

## 06. බෙලෙක්වැඩකරු III ශ්‍රේණිය - Tinsmith Grade III

**අවශ්‍ය සුදුසුකම්:**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන බෙලෙක්වැඩකරු තනතුරට අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

බඳවා ගනු ලබන ආකාරය : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 48,005 – 16x490 – 55,845 (U- PL 3(III)]මාසික

## 07. විද්‍යාගාර සහායක III ශ්‍රේණිය - Laboratory Attendant Grade III

**අවශ්‍ය සුදුසුකම්:**

i. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය සම්මාන සාමාර්ථයන් දෙකක් ද (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරනු ලබන විද්‍යාගාර සහායක තනතුරට අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටමේ 2 හෝ 3 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

ii. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය සම්මාන සාමාර්ථයන් දෙකක් ද (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සහිත වසරක (01) සේවා පළපුරුද්දක් තිබීම.

බඳවා ගනු ලබන ආකාරය : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 44,575 – 16x490– 52,415 (U- PL 2(III)]මාසික

## 08. වැඩ සහායක III ශ්‍රේණිය - Works Aide Grade III

**අවශ්‍ය සුදුසුකම්:**

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

බඳවා ගනු ලබන ආකාරය : වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 42,775 – 16x450– 49,975 (U- PL 1(III)]මාසික

## 09. පුස්තකාල සේවක III ශ්‍රේණිය - Library Attendant Grade III

**අවශ්‍ය සුදුසුකම්:**

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

බඳවා ගනු ලබන ආකාරය : වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 42,775 – 16x450– 49,975 (U- PL 1(III)]මාසික

**සටහන:**

i. **ඉහත දක්වා ඇති තනතුරු සඳහා මූලික වැටුපට අමතරව, ජීවන වියදම් දීමනාව රු. 17,800/- සහ මූලික වැටුපෙන් ප්‍රතිශතයක් ලෙස මාසික අන්තර් දීමනාව ද ගෙවනු ලැබේ.**
ii. **කළමනාකරණසේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 ට අනුව වැටුප් ගෙවනු ලැබේ.**
iii. **විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, විශ්‍රාම වැටුප් අරමුදල සහ සේවක භාර අරමුදල සඳහා හිමිකම් ලබයි.**
iv. **අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.**

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය:** විස්තර සහිත දැන්වීම සහ අයදුම්පත් විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියට (***http://www.itum.mrt.ac.lk***) පිවිසීමෙන් බාගත හැක. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාල සහතික වල පිටපත් සමඟ 2026.08.11 දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **නියෝජ්‍ය ලේඛකාධිකාරී, තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය, දියගම, හෝමාගම** යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ අදාල තනතුර සඳහන් කල යුතුය. රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කල යුතුය. ආයතනික අයදුම්පත් ආකෘතියට අදාල නොවීම, අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙන යම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කල විට කුමන හේතුවක් නිසා හෝ නැවත සළකා බලනු නොලැබේ.

**අධ්‍යක්ෂ,**
**තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය**
2026.07.26